Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 7 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |
|---|---|---|---|

නම .................................................................

සැලකිය යුතුයි;

- ප්‍රශ්න අංක **1** සිට **20** දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව **40**කි.

### I - පත්‍රය

- අංක **01** සිට **05** දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) බුදුරජාණන් වහන්සේ කළගුණ දැක්වීම වශයෙන් අනිමිස ලෝචන පූජාව සිදුකරන ලද්දේ කී වන සතියේදී ද ?
   i. පළමුවන සතියේ දී ය.
   ii. දෙවන සතියේ දී ය.
   iii. තෙවන සතියේ දී ය .
   iv. පස්වන සතියේ දී ය.

2) පෙර භවයක අකුසල කර්මයක් හේතුවෙන් මුලු ශරීරයේම කුෂ්ඨ වැළඳීමෙන් දුකට පත් ව බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ භික්ෂූන් වහන්සේ නමකි.
   i. ආනන්ද හිමි.
   ii. සැරියුත් හිමි.
   iii. මහා කාශ්‍යප හිමි
   iv. පූතිගත්ත තිස්ස හිමි.

3) බුද්ධ රත්නය වන්දනා කරන ගාථාව වන්නේ,
   i. ඉතිපිසෝ පාඨය ය.
   ii. ස්වාක්ඛාතෝ පාඨය ය.
   iii. සුපටිපන්නෝ පාඨය ය.
   iv. කායේන වාචා චිත්තේන පාඨය ය.

4) "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ..." යන පද්‍යය ඇතුළත් කෘතිය නම්,
   i. බුදුගුණ අලංකාරය යි.
   ii. ලෝවැඩ සඟරාව යි.
   iii. ගුත්තිල කාව්‍යය යි.
   iv. සිරිත් මල්දම යි.

5) කරණීය මෙත්ත සූත්‍රය තුළ ඇතුළත් වන්නේ,
   i. බුදු ගුණ ය.
   ii. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණ ය.
   iii. මංගල කරුණු ය.
   iv. තුන් බිය දුරු කිරීමේ ගුණ ය.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **6 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාළ වාක්‍ය කියවා බලා නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

6) බුදු සසුනේ අග්‍ර දායිකාව වන්නේ.......................................................................................යි.
(සුජාතා සිටු දේවිය / විශාඛා සිටු දේවිය / කිසා ගෝතමිය)

7) ධම්ම පදය අයත් වන නිකාය...........................................................................නිකාය යි.
(ඛුද්දක / අංගුත්තර / සංයුක්ත)

8) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ.......................................................................................ය.
(පන්සිල් / අටසිල් /ආජීව අෂ්ටමක සීලය)

9) සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන්ව උපමා කර ඇත්තේ........................................දිශාවට ය.
(උතුරු / නැගෙනහිර / දකුණු)

10) බුද්ධ කාරක ධර්ම යනුවෙන් හඳුන්වන්නේ.............................................................................ය.
( දස පාරමිතා / චතුරාර්ය සත්‍යය /ආර්ය අෂ්ටාංගික මාර්ගය)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසට අදාළ පිළිතුර "ආ"කොටසින් තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

| **"අ" කොටස** | **"ආ" කොටස** |
|---|---|
| 11) ඉවසීම ප්‍රගුණ කළ හිමිනමකි. | (...........) 1. පළමු දේවාචික උපාසකවරු ය. |
| 12) අග්‍ර ශෂ්‍ය දානය, | (...........) 2. අන්‍යෝන්‍ය උපකාරය, සහයෝගය යි. |
| 13) මැනවින් ඉගැන්වීම. | (...........) 3. පුණ්ණ තෙරණුවන් |
| 14) සහජීවනය යනු, | (...........) 4. අලුත් බත් සකසා පූජා කිරීම ය. |
| 15) තපස්සු භල්ලුක | (...........) 5. ගුරුවරයාගේ යුතුකමකි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16) අකුසලයෙන් වෙන්වීම........................................................................ ලෙස හඳුන්වයි.

17) පිසුණාවාචා වේරමණී යන ශික්ෂා පදය.............................. වැළකීම යන අදහස ගෙන දෙයි.

18) මැනවින් හික්මවීම..................................................................විසින් ඉටුකරන යුතුකමකි.

19) ඉවසීමෙන් ලැබෙන්නේ...............................................................................................ය.

20) සිංහලයන් ගේ ආගන්තුක සත්කාරය පිළිබඳ ...............................................තම ප්‍රශංසාව පළකර ඇත.
(රොබට් නොක්ස් /ගුරුවරු /සැනසීම /විරතිය / කේලාම් කීමෙන් /ශිෂ්‍යයින්)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**7 ශ්‍රේණිය බුද්ධ ධර්මය - ii පත්‍රය**

**සැලකිය යුතුයි;**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවල එක ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් II පත්‍රය සඳහා ලැබෙන මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 60කි .**

**1)** **දෙවන වාරයට නියමිත ඇගයීම වූ භූමිකා රංගනය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. භූමිකා රංගනයට අදාළ කරගන්නා ලද ජාතක කතාව කුමක්ද?

ii. භූමිකා රංගනය සඳහා ඔබට ලැබුණු චරිතය කුමක්ද?

iii. එම චරිතය රඟපෑමට ඔබ උපදෙස් ලබා ගත් දෙදෙනෙකු නම් කරන්න.

iv. ඔබට ලැබුණු චරිතය රංගනයට යාමේදී ඔබට ඇති වූ බාධක දෙකක් ලියන්න.

v. භූමිකා රංගනය තුළ ඔබගේ සිත්ගත් චරිත දෙකක් නම් කරන්න.

vi. බෝසත් ගැල් නායකයා අනෙක් ගැල් නායකයාට පළමුව යාමට යැයි පැවසීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

vii. කාන්තාරයේ දී හමුවූ යක්ෂයින්ගේ වහසි බස්වලට බෝසතාණන් වහන්සේ නො රැවටීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.

viii. බෝසත් නායකයා තම කණ්ඩායමේ අයට ගමන පිටත්වීමට පෙර දුන් උපදෙස් දෙකක් ලියන්න.

ix. මෙම ජාතක කථාවේ සඳහන් නායකත්ව ගුණාංග දෙකක් සඳහන් කරන්න.

x. ඔබට ශිෂ්‍ය නායක පදවිය ලැබුණොත් සිසුන්ගේ යහපත උදෙසා ඔබ අනුගමනය කරන කරුණු දෙකක් සඳහන් කරන්න **(ලකුණු2 x10 = 20)**

(2) i. "ගුරු සිත නොරිදවා..." යන පදය සම්පූර්ණ කර ලියන්න. **(ලකුණු 2)**

ii. සිගාලෝවාද සූත්‍රයට අනුව ශිෂ්‍යයන් විසින් ගුරුවරුන්ට ඉටුකරන යුතුකම් තුනක් සඳහන් කරන්න. **(ලකුණු 3)**

iii. ශිෂ්‍යයකු වශයෙන් ඔබ, ඔබේ ගුරුවරයාට ඉටු කරන ලද යුතුකම් පහක් ලියා දක්වන්න. **(ලකුණු 5)**

(3) i. ඔබ දන්නා සිල් වර්ග දෙකක් සඳහන් කරන්න.

ii. සීලය නිවැරදිව අනුගමනය කරන විට යහපතෙහි යෙදීම, හෙවත් සමාදන් වීමේ දී අනුගමනය කළ යුතු කරුණු 3ක් සඳහන් කරන්න.

iii. ගිහියාගේ නිත්‍ය සීලයට අදාල සිල්පද පහෙහි අරුත් ඔබගේ වචනයෙන් ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(4) i. ඉවසීම ප්‍රගුණ කිරීම පිළිබඳ තොරතුරු සඳහන් ජාතක කථාවක් නම් කරන්න.
ii. "සීල ,සමාධි, පඤ්ඤානං - ඛන්ති පධාන කාරණා..."මෙම පාඨයෙහි ඇතුළත් කරුණු තුනක් ඔබේ වචනයෙන් ලියන්න.
iii. ඔබට ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු වුවහොත් (ගැටලුවකට) ඔබ එයට ඉවසීමෙන් මුහුණ දෙන ආකාරය ගැන වාක්‍යය 5ක් ලියන්න.

(5) i. "අක්කොච්ඡි මං අවධි මං - ...................................
................................................ - වේරං තේ සූප සම්මති"
යන ධම්මපද ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
ii. එහි අර්ථය ලියා දක්වන්න.
iii. වෛර නොකිරීම තුළින් සාමකාමී සමාජයක් බිහිකර ගත හැකි ආකාරය පිළිබඳ වාක්‍ය පහක් ඔබේ වචනයෙන් ලියා දක්වන්න.

(6) i. වැඩිහිටියන්ට සැලකීම පිළිබඳ තොරතුරු සඳහන් ජාතක කතා දෙකක් නම් කරන්න.
ii. ඔබ කළ ගුණ සැලකූ අවස්ථා තුනක් සඳහන් කරන්න.
iii. "අපි වැඩිහිටියන්ට සලකමු" යන මාතෘකාව යටතේ වාක්‍ය පහක් ගොඩනගන්න.

(7) i. බුදුගුණ වන්දනා පාඨයෙහි ඇතුළත් ගුණ ගණන කීය ද?
ii. එයින් බුදු ගුණ තුනක් නම් කරන්න.
iii. ඔබ කැමති එක බුදු ගුණයක් විස්තර කර ලියන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

7 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II

පිළිතුරු පත්‍ර

## පිළිතුරු පත්‍රය - I

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

| | | | |
|---|---|---|---|
| (1) - ii | (6) - විශාකා සිටු දේවිය | (11) - 3 | (16) - විරතිය |
| (2) - iv | (7) - බුද්දක | (12) - 4 | (17) - කේලාම් කීමෙන් |
| (3) - i | (8) - පන්සිල් | (13) - 5 | (18) - ගුරුවරු |
| (4) - iv | (9) - දකුණු | (14) - 2 | (19) - සැනසීම |
| (5) - ii | (10) - දස පාරමිතා | (15) - 1 | (20) - රොබට් නොක්ස් |

(ලකුණු2 x 20 = 40)

## පිළිතුරු පත්‍රය - II

- **ප්‍රශ්න අංක i සිට x දක්වා එක ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 20කි.**

(1) i. අපණ්ණක ජාතකය.

ii. බෝසත් ගැල් නායක, අනුවණ(අඥාන) ගැල් නායක, ගැල් කරුවන්, වෙළඳ පිරිස, යක්ෂයින්.... ආදී චරිතයක් ලියා තිබීම.

iii. ගුරු භවතාගන්, දෙමව්පියන්ගෙන්, වැඩිහිටියන්ගෙන්,යහලුවන්ගෙන්.

iv. සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

v. චරිත දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකකි.

vi. අලුත් ලපටි තණකොළ සතුන්ට ආහාරයට දීමට හැකිවීම.මාර්ගයේ දුබල තැන් පළමු යන අය පිළිසකර කරයි යන අදහස.ළපටි පළා නුවණැති ගැල් නායකයාගේ පිරිසට ආහාරයට ගත හැකි වීම.පළමුව ගිය අය කැපූ කැපූ ළිංවලින් ජලය බීමට ගත හැකි වීම.පෙරවෙළඳුන් ඉහළ මිලට බඩු විකුණා ඇත් නම් තම පිරිසට ඊට අඩු මිල නොමැතිවීමට බඩු විකිණිය හැකි වීම...යනාදී කරුණු 2කට ලකුණු දෙකකි.

vii. කාන්තාර වල වර්ෂාව නැති බව දැන සිටීම,කාන්තාරවල විලක් හෝ පොකුණක් නොමැති බව දැන සිටීම, විදුලිය හා ගෙරවීම් හඬ නොමැති බව දැන සිටීම.

viii. බෝසත් ගැල් නායකයාගෙන් නො අසා පැන් නිකරුනේ ප්‍රයෝජනයට නොගන්නා ලෙස දැන්වීම, පෙර නොකන ලද ගෙඩි,කොළ, මල් හා පලා වර්ග බෝසත් නායකයාගෙන් අහන්නේ නැතිව කෑමට එපා කීම.

ix. දුර දක්නා නුවණින් යුක්ත බව. පූර්ව සූදානම හා නුවණින් යුක්ත බව.ඉවසිලිමත් හා විමසිලිමත් බව.

x. සිසුන් ලියා ඇති සාර්ථක පිළිතුරු වලට මුළු ලකුණු ලබා දෙන්න.

(ලකුණු2 x 10 = 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 2 සිට 7 දක්වා ප්‍රශ්නවල,එක කොටසට ලකුණු 2ක් ද,දෙක කොටසට ලකුණු 3ක් ද,තුන්වන කොටසට ලකුණු 5ක් දවන ආකාරයට මුළු ලකුණු 10ක් වන පරිදි ලබා දෙන්න.**

(2) i. " ගුරු සිත නොරිදවා - වේලාව නොවරදවා
බැති පෙම් උපදවා - අකුරු උගනී කුමරු සොඳවා" (ලකුණු 2)

ii. 1. ගුරුතුමා දුටුවිටහුනස්නෙන් නැගී සිටීම.
2. ගුරුතුමාට සියලු ඇප උපස්ථාන සිදු කිරීම.
3. ලබා දෙන උපදෙස් වලට හොඳින් සවන් දී පිළිපැදීම.
4. අවශ්‍ය කටයුතු සිදු කර දීම.
5. හොඳින් ඉගෙනීම. (ලකුණු 3)

iii. සිසුන් ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(3) i. පන්සිල්, අටසිල්,උපසම්පදා සීලය,ආජීවඅෂ්ටමක සීලය,සාමණේර සීලය. (ලකුණු 2)

ii. 1. තමා යහපතෙහි යෙදී ම.
2. අන් අයද යහපතට යොමු කිරීම.
3. යහපත් කටයුතු අනුමත කිරීම හා ඊට අනුබල දීම. (ලකුණු 3)

iii. ගිහියාගේ නිත්‍ය ශීලය අදාලසිල්පද පහෙහි අරුත වන්නේ,
1. ජීවිත විනාශ කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
2. නොදුන්දෙයගැනීමෙන්වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
3. කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
4. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
5. සුරා පානය කිරීමෙන් වැළකීමේ ශික්ෂාපදය සමාදන් වෙමි. (ලකුණු 5)

(4) i. ක්ෂාන්තිවාදී ජාතකය. (ලකුණු 2)

ii. සීල, සමාධි, පඤ්ඤා, ඛන්ති/ ක්ෂාන්තිය. (ලකුණු 3)

iii. පිළිතුරු ලියා ඇති ආකාරය සලකා බලා ලකුණ ප්‍රදානය කරන්න. (ලකුණු 5)

(5) i. අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මේ
යේතං න උපනය්හන්ති - වේරංතේසූපසම්මති (ලකුණු 2)

ii. අසවලා මට බැන්නේ ය, මට පහර දුන්නේ ය, මාපරාජය කළේ ය ,මා සතු දේ පැහැර ගත්තේය,යනුවෙන් යම් අය නැවත නැවතනොසිතත් නම් ඔවුන්ගේ වෛරය සංසිඳෙන්නේය. (ලකුණු 3)

iii. ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න. (ලකුණු 5)

(6) i. සාලිකේදාර ජාතකය, තිත්තිර ජාතකය. (ලකුණු 2)

ii. සිසුන් ලියා ඇති ගැළපෙන පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න. (ලකුණු 3)

iii. මාතෘකාවට අදාලව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(7) i. බුදුගුණ වන්දනා පාඨයෙහි ඇතුළත් ගුණ නමයකි. (ලකුණු 2)

ii. අරහං, සම්මාසම්බුද්ධ, විජ්ජා චරණ සම්පන්න, සුගත, ලෝකවිදූ,අනුත්තරෝපුරිසධම්මසාරථි,සත්ථා දේව මනුස්සානං,බුද්ධෝ, භගවා. (ලකුණු 3)

iii. බුදු ගුණය පැහැදිලි වන ආකාරයට විස්තර කර ඇත්නම් හෝ පිළිතුර ප්‍රමාණවත් නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)